# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

# විශ්වවිද්‍යාල ප්‍රවේශය

# 2020/ 2021 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගිකව පුහුණු කිරීම හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථෙරවාදී බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, තුලනාත්මක සමය අධ්‍යයනය, බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීමට ධෛර්යය දීම යනාදී පරමාර්ථ ඉටුකර ගැනීමේ අරමුණින් සංස්ථාපනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

ඒ සඳහා මෙම විශ්වවිද්‍යාලය, මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

- **ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව** – වසර 04
- **බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව** – වසර 04
- **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව** – වසර 03

**බඳවා ගනු ලබන ආකාරය :**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා 2017, 2018, 2019 හෝ 2020 යන වර්ෂවලදී පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති භික්ෂූන් වහන්සේලාගෙන් හා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගය භාෂාත්‍රයෙන් සමත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ..

- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ලබාගත් ඉසෙඩ් (Z-Score) ලකුණුවල ප්‍රමුඛතාව මත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර එහි දී ලබාගත් ලකුණු පදනම් කරගෙන සිසුන් බඳවා ගනු ලැබේ.
- මේ හැර ප්‍රාචීන භාෂෝපකාර සමාගම් මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත් භික්ෂූන් වහන්සේලා ද තෝරාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10% ක් වන අනුපාතයට බඳවා ගනු ලැබේ.

**ප්‍රවේශ සුදුසුකම්**

| | | |
|---|---|---|
| 01 | බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම | |
| | | හා |
| 02 | i) | බුද්ධ ධර්මය/ බෞද්ධ ශිෂ්ටාචාරය සහ පාලි/ සංස්කෘත / වෙනත් භාෂා විෂයයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම. |
| | | හෝ |
| | ii) | ප්‍රාචීන මධ්‍යම විභාගය භාෂාත්‍රයෙන් සමත් වී තිබීම. |
| | | විශ්වවිද්‍යාලයට තෝරාගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10% ක් වන අනුපාතයට ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත් භික්ෂූන් වහන්සේලා බඳවා ගනු ලැබේ. |
| | | හෝ |
| | | අදාළ වර්ෂයේ බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය ප්‍රමාණය උක්ත සුදුසුකම යටතේ ඉල්ලුම්කර නොමැති කල්හි පහත සඳහන් සුදුසුකම් යටතේ බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයයක්වත් ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම. |
| | | හෝ |
| | iv) | ඕනෑම කලා විෂය ධාරාවක් යටතේ අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.<br>සහ<br>බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයක් යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් (වසරක හෝ ඊට වැඩි) ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම. |
| | | හෝ |
| | v) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.<br>ඉහත අංක i, ii, iii, හා iv යටතේ සුදුසුකම් ඇති ස්වාමීන්වහන්සේලා ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් අංක (V) යටතේ සුදුසුකම් ඇති ස්වාමීන්වහන්සේලා බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |

**අයදුම්පත් ලබා ගැනීම හා යොමු කිරීම :**

www.busl.ac.lk යන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිස අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත අදාළ ලේඛනවල (සහතික කරන ලද) ස්කෑන් කළ පිටපත් හෝ පැහැදිලි ඡායා පිටපත් සමග අනුරාධපුර මහජන බැංකුවේ 008-1001-5001-4462 අංක දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුනරාවර්තන ගිණුමට රු. 200.00 මුදලක් බැරකර ලබාගත් ලදුපත ද සමග 2021.07.30 දින හෝ එදිනට පෙර යොමු කළ යුතුය.

එසේ නොමැති නම් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් බාගත කරගනු ලැබූ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛනවල සහතික කළ පිටපත් හා මුදල් ගෙවූ ලදුපත අමුණා 2021.07.30 දින හෝ එදිනට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර යන ලිපිනයට සීඝ්‍රගාමී තැපැල් (Courier Service) මගින් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර) 2020/2021**" යනුවෙන් සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මහෝපාධ්‍යායයන් වහන්සේ,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුර.**
**2021.06.28**